# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**

නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:


2019 අගෝස්තු මාසයේ දී නිෂ්පාදන ක්‍රියාකාරකම් තවදුරටත් වැඩි වේගයකින් වර්ධනය විය. ඒ අනුව, 2019 ජූලි මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.9 කින් ඉහළ යමින් 2019 අගෝස්තු මාසයේ දර්ශක අගය 56.6 ක් ලෙස වාර්තා කරන ලදී. විශේෂයෙන්ම, එළඹෙන උත්සව සමයට සමගාමීව ඇතිවන ඉල්ලුම සපුරාලීම සඳහා, ආහාර හා පාන වර්ග සහ රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන අංශයන්හි, නිෂ්පාදන සහ නව ඇණවුම් වල සිදුවූ ඉහළ යෑම, නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයේ මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, සේවා නියුක්ති උප දර්ශකය අඩු වේගයකින් ඉහළ යෑම සඳහා, විශේෂයෙන්ම ආහාර හා පාන වර්ග අංශයෙහි සේවා නියුක්තිය ඉහළ යෑම බලපාන ලදී. එනමුදු, රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන අංශයෙහි බොහෝමයක් ප්‍රතිචාර දක්වන්නන් විසින් ශ්‍රම වෙළඳපොළෙහි හිඟතාවයක් පවතින බව ඉස්මතු කරන ලදී.

| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය | 2019 ජූලි මාසයට සාපේක්ෂව |
|---|---|
| **56.6** | **දර්ශකාංක 0.9 ක ඉහළ යාමකි.** |

| විචල්‍යය | ජූලි | අගෝ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | 55.7 | 56.6 | + | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ඇණවුම් | 59.0 | 61.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 57.5 | 60.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 52.0 | 50.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ගැනුම් තොගය | 57.0 | 55.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 50.0 | 50.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මේ අතර, ගැනුම් තොග උප දර්ශකය අඩු වේගයකින් ඉහළ යන ලදී. තවද, නව ඇණවුම් සහ නිෂ්පාදන වැඩි වේගයකින් වර්ධනය වීම මධ්‍යයේ වුවද, ගැනුම් තොග අඩු වේගයකින් වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් පසුගිය මාසයේ එක්රැස් කරගත් අමුද්‍රව්‍ය තොග හේතු විය. තවද, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය වැඩි වේගයකින් වර්ධනය විය.

සලකනු ලැබූ කාල සීමාවේදී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි සියලුම උප දර්ශක, කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කරමින්, නිෂ්පාදන ක්‍රියාකාරකම්වල සමස්ත වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

2019 අගෝස්තු මාසයේ දී සේවා අංශය අඛණ්ඩව අඩු වේගයකින් වර්ධනය වෙමින් 52.9 ක දර්ශක අගයක් වාර්තා කළ අතර, ඊට ප්‍රධාන වශයෙන් හේතු වූයේ නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ක්‍රියාකාරකම් උප දර්ශකවල ඉහළ යෑමයි.

2019 අගෝස්තු මාසයේ දී ව්‍යාපාර ක්‍රියාකාරකම් වර්ධනය වූ අතර, සංචාරක පැමිණීමෙහි වර්ධනයත් සමග නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවා උප අංශයෙහි සිදු වූ වර්ධනය ඊට ප්‍රධාන වශයෙන් හේතු විය. 2019 අගෝස්තු මාසයේ දී නව ව්‍යාපාර ද වර්ධනය වූ අතර, මූල්‍ය සේවා සහ ප්‍රවාහන යන උප අංශයන්හි මෙම ප්‍රවණතාව ප්‍රමුඛ වශයෙන් දක්නට ලැබුණි.

සේවා නියුක්තිය පිළිබඳ සලකා බැලීමේ දී, විශ්‍රාම යෑම් සහ පුරප්පාඩු සඳහා නව බඳවා ගැනීම් ප්‍රමාද වීම හේතුවෙන් පසුගිය මාසයට සාපේක්ෂව අගෝස්තු මාසයේ දී කාර්ය මණ්ඩල සේවක ප්‍රමාණය පහළ යෑමක් වාර්තා කළේය. මේ අතර, ඉල්ලුමෙහි ඇතිවන කවර හෝ ඉහළ යෑමකට සේවා සපයන්නන්හට පවත්නා තත්ත්වය යටතේ මුහුණ දීමට හැකි බව පෙන්නුම් කරමින් නිම කිරීමට ඇති කාර්යයන් උප දර්ශකය, එහි කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා අඩු අගයක් වාර්තා කරන ලදී.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**


**52.9**

**2019 ජූලි මාසයට සාපේක්ෂව දර්ශකාංක 4.2 ක පහළ යෑමකි.**

| විචල්‍යය | ජූලි | අගෝ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **57.1** | **52.9** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ව්‍යාපාර | 59.9 | 52.7 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 63.5 | 59.6 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 43.2 | 43.6 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 47.7 | 45.3 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 71.4 | 63.4 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ සලකා බැලීමේදී, 2019 ජූලි මාසයට සාපේක්ෂව 2019 අගෝස්තු මාසයේ දී සේවා සපයන්නන්ගේ ඉදිරි මාස 3 සඳහා වන ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂා අඩු වේගයකින් වර්ධනය විය.

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.